පොදු චක්‍රලේඛ අංක 01 - 37/2007 (I)

මගේ අංකය:FHB/SH/Gen/2015
385, බද්දේගම විමලවංශ මාවත, කොළඹ 10
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශ
ලේකම් කාර්යාලය
2016 | 01 | 06 දින

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම විශේෂ වැඩසටහන් භාර අධ්‍යක්ෂවරුන්
අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
රෝහල් අධ්‍යක්ෂවරුන් ඇතුළු සියළුම රෝහල් භාර වෛද්‍ය නිලධාරීන්
සියළුම මහ නගර සභා, ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
සියළුම මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්
සියළුම පාසල් වෛද්‍ය නිලධාරීන්

## පාසල් සෞඛ්‍ය වැඩසටහන

සෞඛ්‍ය අමාත්‍යංශය මගින් නිකුත් කරන ලද 01.37/2007 අංක දරණ 2007.11.26 දිනැති චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදි.

සෞඛ්‍ය අමාත්‍යංශය මඟින් 1918, කොළඹ නගර සභා බල ප්‍රදේශයේ පාසල් සෞඛ්‍ය වැඩසටහන ආරම්භ කරන ලදී. 1926 ජාතික සෞඛ්‍ය විද්‍යායතනය ස්ථාපිත කිරීමෙන් ඇරඹුණු සෞඛ්‍ය ඒකක පිහිටුවීමත් සමගම මෙම වැඩසටහන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යභාරයක් බවට පත්විය. කොළඹ, ගාල්ල, යාපනය හා මහනුවර යන ප්‍රධාන නගරවල එම කටයුතු සඳහා පාසල් වෛද්‍ය නිලධාරීන් ද, මහ නගර සභාවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ද පත්කර ඇත.

පාසල් සෞඛ්‍ය වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වන්නේ "ස්වකීය සෞඛ්‍යය මෙන්ම තම පවුලේ හා සමාජයේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම හා දෙන ලද අධ්‍යාපන අවස්ථා වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට හැකියාවක් ඇති දරු පරපුරක් ඇති කිරීම"යි. මෙම අරමුණ කරා ළඟා වීමට සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යංශ දෙකේ එකඟත්වයෙන් පාසල්, සෞඛ්‍ය ප්‍රවර්ධන ස්ථාන බවට පත් කිරීමට කටයුතු යොදා ඇත. (ලෝක සෞඛ්‍ය සංවිධානයේ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රමවේදයන්ට අනුකූලව).

පරිසරය හා මානව හැසිරීම් මත බැඳුණු බෝවන හා බෝ නොවන රෝග වැඩිවීමත් සමග වෛද්‍ය පරීක්ෂණයට අමතරව සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පාසල් ප්‍රජාව බලකරණය කිරීමද 2007 සිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩලයට භාර විය. 2011 වසරේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සකස් කරන ලද "මිනිස් අයිතිවාසිකම් සැලසුම" මගින් මෙහි වැදගත්කම ඉස්මතුකොට ඇත.

සියළු පාසල් දරුවන්ට පාසල තුල සෞඛ්‍ය සේවා සැපයීමට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය බැඳී ඇත. එමනිසා වෛද්‍ය පරීක්ෂණය සිදු කිරීම, ආබාධ සහිත දරුවන් ප්‍රතිකාර කර නිවැරදි කිරීම, අවශ්‍ය විශේෂඥ වෛද්‍ය සේවාවන් වෙත යොමු කිරීම, පසු විපරම් කිරීම හා සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු සඳහා පාසල් ප්‍රජාව බලකරණය කිරීම අවශ්‍ය වේ.

ඒ අනුව පහත සඳහන් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රමවේදයන් අධ්‍යාපන අමාත්‍යංශයේ පරිපාලනය යටතේ පවතින, දිවයින පුරා ඇති සියලු රජයේ පාසල්, විශේෂ අධ්‍යාපන ඒකක, පිරිවෙන් හා පෞද්ගලික පාසල් වලට හඳුන්වාදීමට කටයුතු යොදා ඇත.

1. සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති සැකසීම
2. සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය
3. සෞඛ්‍ය ප්‍රවර්ධනයට හිතකර පරිසරයක් ඇති කිරීම
4. සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පාසල් ප්‍රජා සබඳතා වර්ධනය
5. සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීම

මෙම කරුණු පිළිබඳ වැඩි විස්තර සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කල "පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන" පොතේ පිටු අංක 3-6 බලන්න.

පාසල් සහ නවයොවුන් සෞඛ්‍ය සඳහා මධ්‍ය කේන්ද්‍රිය ස්ථානය ලෙස සෞඛ්‍ය අමාත්‍යංශය විසින් පවුල් සෞඛ්‍ය කාර්යාංශය නම් කර ඇත. අධ්‍යාපන අමාත්‍යංශයේ පාසල් සෞඛ්‍ය කටයුතු පිළිබද මධ්‍ය කේන්ද්‍රිය ස්ථානය ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා පෝෂණ) නම් කර ඇත.

**පාසල් සෞඛ්‍ය වැඩසටහන් අරමුණු**

1. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමෙහිලා, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල ඇති සහයෝගය හා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම
2. පාසල් ළමුන්ගේ පූර්ණ වර්ධනය සහ සංවර්ධනය සඳහා අවශ්‍ය අවස්ථා හඳුනා ගැනීම
3. සුදුසු සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මගින් පාසල් ළමුන්ට තමන්ගේ සෞඛ්‍යයට බලපාන හේතු සාධක පාලනය කිරීම හා ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාවන් වැඩි දියුණු කිරීම
4. පවුල හා සමාජය තුල සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා විපර්යාස-කාරකයන් ලෙස කටයුතු කිරීමට පාසල් ළමුන් තුල ඇති හැකියා වැඩි දියුණු කිරීම
5. ඉගෙනීම හා ඉගැන්වීම සඳහා සුදුසු පරිදි පාසල් පරිසරය සෞඛ්‍යවත් ලෙස හා ආරක්ෂාකාරී ලෙස සකස් කිරීම
6. බෝවන හා බෝ-නොවන රෝග වලින් පාසල් දරුවන් ආරක්ෂා කිරීම
7. සෞඛ්‍ය ගැටළු හැකි ඉක්මනින් හඳුනා ගෙන පිළියම් කිරීම සඳහා පාසල් ළමුන් වෛද්‍ය පරීක්ෂණවලට ලක් කිරීම
8. නිතිපතා සොයා බැලීම් හා සුදුසු මැදිහත්වීම් තුලින් පාසල් දරුවන්ගේ පෝෂණ තත්වය වැඩි දියුණු කිරීම හා හිතකර සෞඛ්‍ය පුරුදු ප්‍රගුණ කිරීම
9. පාසල් සෞඛ්‍ය කටයුතු සංවර්ධනය සඳහා උපරිම ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම
10. පාසල් සෞඛ්‍ය වැඩසටහනේ සාර්ථකත්වය සඳහා නියාමන හා ඇගයීම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම

පළාත් මට්ටමින් එම වගකීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ද, දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ද පැවරී ඇත. පාසල් සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් මට්ටමින් මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරු ද, ප්‍රාදේශිය මට්ටමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරු ද (නගර සභා බල ප්‍රදේශ තුල ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්/පාසල් වෛද්‍ය නිලධාරීන් ද) කේන්ද්‍රිය වගකීම දරණ නිලධාරීන් බවට පත්වේ. ඔවුන්ගේ අධීක්ෂණය යටතේ පාසල තුල පාසල් සෞඛ්‍ය වැඩසටහන සංවිධානය කිරීමේ වගකීම මහජන සෞඛ්‍ය පරීක්ෂක සතුවේ. පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ද, මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනීයන්ද, පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීයන්ද, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීයන්ද, පාසල් සෞඛ්‍ය කටයුතුවලට දායක විය යුතුය.

පළාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥ/ප්‍රාදේශිය වසංගත රෝග විද්‍යාඥ/ප්‍රාදේශිය දන්ත ශල්‍ය වෛද්‍ය/මානසික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/බෝ-නොවන රෝග පිළිබඳ වෛද්‍ය නිලධාරී/වෛද්‍ය නිලධාරී සැලසුම්/පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක/දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක/පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක/ප්‍රාදේශිය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනී/මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනී/සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී ඇතුළු සියළු පළාත් සහ දිස්ත්‍රික් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, පාසල් සෞඛ්‍ය වැඩසටහන් සැලසුම් කිරීමේදි, ක්‍රියාත්මක කිරිමේදි, නියාමනය සහ ඇගයීම් සඳහා අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික මග පෙන්වීම සිදුකල යුතුය.

අධ්‍යාපන නිලධාරීන් සමඟ එක්ව ගැටළු විශ්ලේෂණය කොට සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනාගැනීමත්, ඒ කාර්යයන් සපුරාලීම සඳහා අවශ්‍ය සැලැස්ම පිළියෙළ කිරීමත් පාසල් ප්‍රජාවගේ දායකත්වය ඇතිව සිදු කල යුතුය.

**සෞඛ්‍ය නිලධාරීන්ගේ වගකීම් වන්නේ**

- පාසල් ප්‍රජාවගේ සෞඛ්‍ය දියුණු කිරීමට අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ කටයුතු කිරීම
- ශිෂ්‍යයන්ගේ වර්ධනය සහ සංවර්ධනය සඳහා අවශ්‍යතා හඳුනාගෙන ඒ සඳහා විසඳුම් සෙවීමට මඟ පෙන්වීම
- ගැටළු විශ්ලේෂණය කර පාසල් සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සහ පාසල් සෞඛ්‍ය වැඩ සැලසුමක් සකස් කර ගැනීමට පාසල් සෞඛ්‍ය සමාජයට උපදෙස් දීම
- සෞඛ්‍ය සහ ජීවිතය සම්බන්ධ තීරණ ගැනීමේදී අවශ්‍ය වන දැනුම, ආකල්ප හා කුසලතා පාසල් ප්‍රජාව තුළ ඇති කිරීම
- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ආරම්භය හා පැවැත්ම සඳහා අවශ්‍ය ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම
- වෛද්‍ය පරීක්ෂණ මගින් සහ යොමු කිරීම් මගින් පාසල් ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීමට උදවුවීම
- පාසල් දරුවන්ගේ මානසික සෞඛ්‍ය ගැටළු හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීම
- විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හඳුනාගෙන ප්‍රතිකාර කිරීමට ක්‍රමවේදයන් ඇති කිරීම
- ගුරුවරුන්ගේ ප්‍රජනක සෞඛ්‍ය ඉගැන්වීම, උපදේශනය සහ මනෝ සමාජීය නිපුණතා (ජීවන නිපුණතා) ඉගැන්වීමේ කුසලතා දියුණු කිරීම
- පාසල් පරිසරය ආරක්ෂිතව, හිංසනයෙන්, අපයෝජනයෙන් සහ ශාරීරික හා මානසික දඬුවම් වලින් තොරව පවත්වා ගැනීමට මග පෙන්වීම
- පාසල් වෛද්‍ය පරීක්ෂණය සහ වාර්ෂික පාසල් සෞඛ්‍ය සමීක්ෂණය සිදුකිරීම සහ සංක්ෂිප්ත වාර්තාව පාසලට ලබාදීම අධීක්ෂණය
- බෝවන සහ බෝ-නොවන රෝග වලින් වැලකි සිටීමට පාසල් ප්‍රජාවට මග පෙන්වීම
- මදුරු මර්දන වැඩසටහන අධීක්ෂණය කිරීම
- යකඩ, ෆෝලික් අම්ල, විටමින් සී අතිරේකය ලබාදීමේ වැඩසටහන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම
- දිවා ආහාර වැඩසටහන අධීක්ෂණය කිරීම
- පාසල් ආපන ශාලා අධීක්ෂණය
- පාසල් සෞඛ්‍ය ක්‍රියාකාරකම් වලට ප්‍රජාවේ සහාය ලබා ගැනීමට කටයුතු කිරීම
- පාසල් ශිෂ්‍යයන් ප්‍රජා ක්‍රියාකාරකම් වලට සහභාගි වීමට මග පෙන්වීම
- දරුවන්ගේ මනෝ සමාජීය කුසලතා (ජීවන නිපුණතා) දියුණු කිරීමට ආධාර කිරීම
- අධ්‍යාපන නිලධාරීන් සමඟ පාසල් සෞඛ්‍ය වැඩසටහන නියාමනය, ඇගයීම සහ ප්‍රතිපෝෂණයක් ලබාදීම

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ අනිකුත් පළාත් සහ දිස්ත්‍රික් සෞඛ්‍ය නිලධාරීන් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන පාසල් බවට දියුණු කිරීමට අධ්‍යාපන බලධාරීන්ට මග පෙන්වීම සහ සහයෝගය ලබාදිය යුතුයි.

නිතිපතා සිදුකරන පාසල් සෞඛ්‍ය කටයුතු එනම්, පාසල් වෛද්‍ය පරීක්ෂණ, ගුරුවරුන් සහ සිසුන් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, අධ්‍යාපන නිලධාරීන් සඳහා උද්දේශන වැඩසටහන්, පාසල් සෞඛ්‍ය සමාජයේ වැඩකටයුතු යනාදිය ඉටු කිරීමේදී ජාතික මට්ටමේ අධ්‍යාපන හෝ සෞඛ්‍ය අමාත්‍යාංශ වලින් අවසර ගත යුතු නොවේ. නමුත් ඒ කටයුතු ද අධ්‍යාපන අමාත්‍යාංශයේ පළාත්, කළාප සහ කොට්ඨාස අධ්‍යක්ෂවරුන් සමඟ සැලසුම් කර ඒවා **පළාත් සෞඛ්‍ය, සහ පළාත් අධ්‍යාපන ආංශික සංවර්ධන සැලසුමට** ඇතුළත් කල යුතුයි.

**(ඇමුණුම ඒ බලන්න )**

**සමස්ථ පාසල් සෞඛ්‍ය වැඩසටහන පහත පරිදි කොටස්වලට බෙදාවෙන්කල හැක**

1. වර්ෂය මුලදී සිදුකල යුතු පාසල් සෞඛ්‍ය වැඩකටයුතු
2. "පාසල් සෞඛ්‍ය දිනයේදී" සිදුකල යුතු පාසල් සෞඛ්‍ය වැඩ කටයුතු
3. වර්ෂය මුළුල්ලේ සිදුකල යුතු පාසල් සෞඛ්‍ය වැඩකටයුතු

**වර්ෂය මුලදී සිදුකල යුතු පාසල් සෞඛ්‍ය වැඩකටයුතු**

**පාසල් සෞඛ්‍ය සමීක්ෂණය** - මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් වසරේ පළමු කාර්තුව ඇතුලතදී සම්පූර්ණ කල යුතු අතර, මෙම පාසල් සෞඛ්‍ය සමීක්ෂණ වාර්තාවේ පිටපතක් (H 1015A) විදුහල්පති වෙත ලබාදී පාසලේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්වල අඩුපාඩු සකස් කර ගැනීමට උපදෙස් දිය යුතුය.

**පාසල් සෞඛ්‍ය දිනය**

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ නගර සභාවල ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් පාසල් සෞඛ්‍ය කටයුතු සඳහා සෑම සතියකම එක් දිනයක් වෙන්කිරීම අනිවාර්ය වේ. මෙම ක්‍රියාමාර්ගය තුලින් පාසල් සෞඛ්‍ය කටයුතු සඳහා ප්‍රමුඛත්වයක් ලැබේ. එසේ වෙන් කරගන්නා දිනය "පාසල් සෞඛ්‍ය දිනය" ලෙස සැලකිය යුතුයි.

පාසල් ප්‍රජාවේ ක්‍රියාකාරී සහභාගීත්වයෙන්, පාසල් සෞඛ්‍ය වැඩසටහනේ ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීමේ වගකීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/පාසල් වෛද්‍ය නිලධාරී/නගර සභා බල ප්‍රදේශවල ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෙත පැවරේ. ඔවුන්ගේ අධීක්ෂණය යටතේ එම වැඩසටහන් සංවිධානය සහ සම්බන්ධීකරණය කිරීමේ වගකීම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට පැවරේ.

**පාසල් සෞඛ්‍ය දිනයේදී සිදු කල යුතු ක්‍රියාකාරකම්**

1. පාසල් වෛද්‍ය පරීක්ෂණය
2. හඳුනාගත් රෝග සඳහා ප්‍රතිකාර ලබාදීම හා යොමුකිරීම
3. ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීම
4. දැනුවත් කිරීමේ දේශන හෝ වැඩසටහන්
5. ගුරුවරුන් සඳහා බෝ නොවන රෝග සායනය/සුවනාරී සායනය
6. සෞඛ්‍ය දත්ත ලේඛනගත කිරීම සහ අදාල වාර්තා පාසලට ලබාදීම

7. පහත වැඩසටහන් වල ප්‍රගතියද අධීක්ෂණය කරන්න
   - සතිපතා යකඩ, ෆෝලික් අම්ල, විටමින් සී අතිරේකය ලබාදීමේ වැඩසටහන (WIFS)
   - පාසල් දන්ත සේවාව ලබාදීම
   - මදුරු මර්දන වැඩසටහන
   - පාසල් ආපන ශාලා අධීක්ෂණය

**1. පාසල් වෛද්‍ය පරීක්ෂණය (ඇමුණුම බී බලන්න)**

පාසල් වෛද්‍ය පරීක්ෂණ ආවරණය 100% විය යුතුය. **පාසල් වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම සහ ආවරණය කිරීමේ වගකීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්/පාසල් වෛද්‍ය නිලධාරීන් වෙත පැවරේ.** අවශ්‍යතාවය අනුව ඉල්ලීමක් සිදුකර අවශ්‍ය සම්පත් ලබාගත යුතුය. අවශ්‍ය සම්පත් ලබාදීම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ වගකීමකි. (අවට රෝහල්වල වෛද්‍ය නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට අමතරව පාසල් දරුවන්ගේ දෙමාපියන්/ඥාතීන් හා ආදි ශිෂ්‍යයන් අතරද වෛද්‍ය නිලධාරීන් සිටීනම් ඔවුන්ගේ සහයද ලබාගැනීමට හැක.)

**පසුගිය වසරේදී පාසල් වෛද්‍ය පරීක්ෂණය සිදු නොකල පාසල් සඳහා මෙම වසරේදී ප්‍රමුඛතාවය ලබාදිය යුතුයි.**

2. හඳුනාගත් රෝග සඳහා ප්‍රතිකාර ලබාදීම හා යොමුකිරීම

පාසල් දරුවන් ආසන්නතම රෝහලේ විශේෂඥ වෛද්‍ය සායන වෙත යොමුකල හැක. (මෙහිදී **බාහිර රෝගී අංශය හරහා යෑම අවශ්‍ය නොවේ.** පොදු චක්‍රලේඛ අංක 02-32/2002). පාසල් දරුවන් සඳහාම වෙන්වූ විශේෂිත විශේෂඥ සායන නොමැති රෝහල්වල, එම සායන මාතෘ හා ළමා වෛද්‍ය නිලධාරී හා දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ මැදිහත්වීමෙන් යලි ස්ථාපනය කළ යුතුයි.

අවුරුදු 5 -19 ත් අතර පාසල් දරුවන්ගේ **වයසට අදාල ශරීර ස්කන්ධ දර්ශකය** තක්සේරු කිරීම සඳහා WHO Growth Standerd භාවිතා කරන්න. පාසල් දරුවකුගේ **වයසට අදාල ශරීර ස්කන්ධ දර්ශකය** <-SD ලෙස හඳුනාගතහොත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පළමුවෙන්ම පැවැත්වෙන සායනය වෙත යොමු කරන්න. නිවැරදි නොවූ ගැටළු විශේෂඥ වෛද්‍යසායනය වෙත යොමු කරන්න. පාසල් දරුවකුගේ වයසට අදාල ශරීර ස්කන්ධ දර්ශකය 2SD ට වැඩිනම් හෝ අධික නිරක්තියෙන් පෙලේ නම් වහාම විශේෂඥ වෛද්‍ය වෙත යොමු කරන්න. මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් අධි බර, මිටි හෝ රක්තහීනතාවයෙන් පෙළෙන අනෙකුත් දරුවන්හට පෝෂණ සහ ජීවන රටාව නිවරදි කරගන්නා ආකාරය පිළිබඳ දැනුවත් කරන්න. පසු විපරමේදී නිවැරදි නොවූ පෝෂණ ගැටළු සහිත දරුවන් සෞ.වෛ.නි කාර්යාලයේ පෝෂණ සායනය වෙත යොමු කරන්න.

පාසල් දරුවන්ගේ මානසික ගැටළු හඳුනාගැනීම පිණිස ප්‍රදේශයේ මනෝ වෛද්‍ය විශේෂඥ හෝ වෛද්‍ය නිලධාරී (මානසික සෞඛ්‍ය) ලවා ඔබේ කාර්යය මණ්ඩලය පුහුණු කරවා ගන්න. හඳුනාගත් දරුවන් ප්‍රදේශයේ මනෝ වෛද්‍ය සායන වෙත හෝ ළමා රෝග විශේෂඥවරුන් වෙත යොමු කරන්න.

3. ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීම

මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පාසල් වෛද්‍ය පරීක්ෂණ දිනයේදීම ප්‍රතිශක්තිකරණ කටයුතු සිදුකල යුතුයි. හදිසි අසාත්මික තත්ත්වයන්ට ප්‍රතිකාර කිරීමට පුහුණු වූ වෛද්‍යවරයෙකු/මහජන සෞඛ්‍ය හෙදි සොයුරියක්/මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් එම ස්ථානයේ සිටිය යුතුය. වැඩි විස්තර සඳහා වසංගතරෝග අංශය විසින් 23/08/2011 දින නිකුත් කරන ලද 01-20/2001 දරණ චක්‍රලේඛය බලන්න.

ප්‍රතිශක්තිකරණය තනි කටයුත්තක් ලෙස නොව වෛද්‍ය පරීක්ෂණයේම කොටසක් ලෙස සිදුකල යුතුය. මේ සඳහා පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක, මහජන සෞඛ්‍ය හෙදි සොයුරිය හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ සහභාගීත්වය ලබාගත හැක.

| | |
|---|---|
| ද්විත්ව පෝලියෝ (DT/OPV) | 1 ශ්‍රේණියේ සියළු ළමුන් සඳහා, කලින් ලබාදී නොමැති නම් |
| වැඩිහිටි පිටගැස්ම ගලපටල (aTd) | 7 ශ්‍රේණියේ සියළු ළමුන් සඳහා |
| MMR | රුබෙල්ලා අඩංගු එන්නතක් කලින් ලබාදී නොමැති 8 ශ්‍රේණියේ සියළු ළමුන් සඳහා |

ලබාදෙන සියළු එන්නත් ළමා සෞඛ්‍ය වර්ධන සටහනෙහි සටහන් කළ යුතුය.

4. දැනුවත් කිරීමේ දේශන හෝ වැඩසටහන්

පහත ශ්‍රේණිවල සියළුම දරුවන් සඳහා යෝජිත දැනුවත් කිරීම් අනිවාර්යයෙන්ම සිදු කරන්න

| ශ්‍රේණිය | වැඩසටහන |
|---|---|
| ප්‍රාථමික | මුඛ සෞඛ්‍ය, බෝ නොවන රෝග හා අපයෝජන වලින් ආරක්ෂා වීම |
| 6-7 | ජීවන නිපුණතා |
| 8-9 | ප්‍රජනක සෞඛ්‍ය හා ජීවන නිපුණතා |
| 9 | 9 ශ්‍රේණියට උගන්වන සියළු ගුරු භවතුන්ට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ කෙටි දැනුවත් කිරීමක් සිදුකරන්න. මෙහිදී අඩු වයස් ගැබ් ගැනීම් වැලැක්වීම සඳහා ගුරුවරුන්ගේ කාර්යභාරය ඉස්මතු කරන්න.<br>9 ශ්‍රේණයේ සියළුම දරුවන් ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ හා ගැබ් ගැනීම් වලක්වා ගැනීම පිළිබඳ දැනුවත් වීම අනිවාර්ය වේ. |
| 10-11 | ප්‍රජනක සෞඛ්‍ය, අනාගත ජීවිතය සැලසුම් කිරීම හා ජීවන නිපුණතා |

අවම වශයෙන් පහත සෞඛ්‍ය කටයුතු සිදු කිරීමට පාසල් දරුවන් බලකරණය කල යුතුය.

- ශරීර ස්කන්ධ දර්ශකය මැන, තක්සේරු කර මැදිහත්වීම් කර ගැනීම
- තනිව ඇස් පරීක්ෂා කර ගැනීම
- තමන්ගේ ආහාර වේලෙහි පෝෂණ වටිනාකම මැන බැලීම
- තමාගේ ශාරීරික යෝග්‍යතාවය මැන බැලීම

5. ගුරුවරුන් සඳහා බෝ නොවන රෝග සායනය/සුවනාරී සායනය

පාසල් වෛද්‍ය පරීක්ෂණය සිදුකරන දිනයේදී හෝ වෙනත් දිනයකදී ගුරු මණ්ඩලය සඳහා ද බෝ නොවන රෝග කලින් හඳුනාගැනීම සඳහා පරීක්ෂා කිරීම සහ සුවනාරී සායන පවත්වන්න. එමගින් ගුරු කාර්ය මණ්ඩලයේ සහයෝගීතාවය වර්ධනය වේ.

6. සෞඛ්‍ය දත්ත ලේඛනගත කිරීම

පාසල් වෛද්‍ය පරීක්ෂණයේදී සෞඛ්‍ය දත්ත ලේඛන ගත කිරීම සඳහා දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහන (CHDR) භාවිතා කිරීම අනිවාර්ය වේ. දරුවාගේ සෞඛ්‍ය වර්ධන සටහනෙහි (CHDR) හා සෞඛ්‍ය ගැටළු සටහනේ (H 456) යන දෙකෙහිම දත්ත සටහන් කල යුතුයි.

ශිෂ්‍ය සෞඛ්‍ය සටහන ( H 457) භාවිතය ක්‍රමයෙන් ඉවත් කල යුතුයි.

- පාසල් වෛද්‍ය පරීක්ෂණ සාරාංශය (H 1247) පිටපතක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකටද
- පාසල් වෛද්‍ය පරීක්ෂණ සාරාංශය (H 1247) පිටපතක් විදුහල්පතිටද
- සෞඛ්‍ය ගැටළු සටහනේ (H 456) සාරාංශයක් පංතිභාර ගුරුවරයාට ද ලබා දෙන්න
- පාසල් සෞඛ්‍ය සමීක්ෂණ වාර්තාවේ (H 1015A) පිටපතක්ද විදුහල්පතිට ලබා දෙන්න

ආකෘතිපත්‍ර පිරවීමේ ගැටළු නිරාකරනය කරගනු පිණිස, පවුල් සෞඛ්‍ය කාර්යාංශය විසින් සම්පාදිත පාසල් සෞඛ්‍ය දත්ත පද්ධතියට අදාල ආකෘතිපත්‍ර පිරවීම සඳහා උපදෙස් පොත බලන්න. මේ සඳහා සංශෝධනය කර 2015 දී මුද්‍රණය කල ආකෘතිපත්‍ර භාවිතා කරන්න.

වර්ෂය මුළුල්ලේ සිදුකල යුතු පාසල් සෞඛ්‍ය වැඩකටයුතු

1. සතිපතා යකඩ, ෆෝලික් අම්ල, විටමින් සී අතිරේකය ලබාදීමේ වැඩසටහන නියාමනය (WIFS)
2. පාසල් දන්ත සේවාව ලබාදීම
3. මදුරු මර්දන වැඩසටහන
4. පාසල් ආපන ශාලා අධීක්ෂණය
5. දැනුවත් කිරීමේ වැඩසටහන්
6. පසු විපරම

1. සතිපතා යකඩ, ෆෝලික් අම්ල, විටමින් සී අතිරේකය (WIFS) ලබාදීමේ වැඩසටහන් නියාමනය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 02-08/2007(1) අංක දරණ 2013/03/25 දිනැති සතිපතා යකඩ ෆෝලික් අම්ල, විටමින් සී අතිරේකය චක්‍රලේඛය සහ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ 2013/01 අංක දරණ 2013/06/03 දිනැති චක්‍රලේඛයට අනුකූලව, 1-13 ශ්‍රේණිවල සියළු ළමුන්ට යකඩ, ෆෝලික් අම්ල හා විටමින් සී පෙති 1 බැගින් ලබාදේ. මෙම අතිරේකය සෑම වසරකම පළමු කාර්තුවේදී ආරම්භ කර සතිපතා මාස 06 ක් (සති 24ක්) ලබාදේ. නියමිත මාත්‍රාව වන්නේ ෆෙරස් සල්ෆේට් මිලිග්‍රෑම් 200ක්, විටමින් සී මිලිග්‍රෑම් 100ක් හා ෆෝලික් අම්ල මිලිග්‍රෑම් 1කි. **මීට ඉහතදී ෆෝලික් අම්ල මිලිග්‍රෑම් 2ක් ලබාදුන් අතර 2015 වර්ෂයේ සිට එය මිලිග්‍රෑම් 1ක් දක්වා අඩුකර ඇත.**

සියළු දරුවන්ට වැඩසටහන් ආරම්භයේදී මෙබැන්ඩසෝල් මිලිග්‍රෑම් 500 පෙති 1 බැගින් ලබාදේ. උතුරු, නැගෙනහිර, මධ්‍යම, සබරගමු හා ඌව යන පළාත්වල දරුවන්ට අතිරේක පණු පෙත්තක් සති 24 අවසානයේදී ලබාදෙන්න. මෙම වැඩසටහන් නියාමනයට කටයුතු කරන්න.

2. පාසල් දන්ත සේවාව ලබාදීම

පාසල් සෞඛ්‍ය වැඩසටහනේ පාසල් දන්ත සේවාව අනිවාර්ය අංගයක් වේ. පාසල් දරුවන්ට සේවාව ලබාදීම දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ගේ සහ පාසල් දන්ත චිකිත්සකවරියන්ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කල යුතුයි. පාසල් දන්ත සේවාව නොමැති අවස්ථාවලදී හඳුනාගත් මුඛ රෝග සහිත දරුවන් ආසන්නතම පාසල් දන්ත සායනය/සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය/රෝහල වෙත යොමු කරන්න.

මේ පිළිබඳ වැඩිදුර විස්තර FHB/OHU/SDS/2011/02 අංක දරණ 2011/11/25 දිනැති පාසල් දන්ත සේවාවට ජාතික ඉලක්ක හඳුන්වාදීම පිළිබඳ චක්‍රලේඛණයෙන් ලබා ගතහැක.

3. මදුරු මර්දන වැඩසටහන්

පාසල් භූමිය හා අවට පරිසරය සතියකට වරක් පරීක්ෂා කරන බවටත් මදුරුවන් බෝවන ස්ථානවලින් තොර බවටත් තහවුරු කරගන්න.

4. පාසල් ආපන ශාලා අධීක්ෂණය

පාසල් හා පිරිවෙන් හා අනෙකුත් අධ්‍යාපන ආයතනවල ආපන ශාලා H800 (ආහාර පරිහරණ ආයතන ශ්‍රේණිගත කිරීම) මගින් අධීක්ෂණය කරන්න. පසු විපරම් තුලින් ඒවයේ ගුණාත්මකභාවය ඉහල නැංවීමට කටයුතු කරන්න. අධ්‍යාපන අමාත්‍යාංශයේ 2011/01/18 දින 2011/03 දරණ ආපන ශාලා චක්‍රලේඛය පිළිබඳ ඔබගේ අවධානය යොමු කරන්න.

"පාසල් ආපන ශාලා තුල නොතිබිය යුතු ආහාර ලැයිස්තුව" හා "ආහාර තෝරා ගැනීම සඳහා වන වර්ණ දර්ශකය" ආපන ශාලාව තුල ප්‍රදර්ශනය කල යුතුය.

ආපනශාලා ප්‍රතිපත්තියට විරුද්ධව කටයුතු සිදුකෙරෙන අවස්ථාවලදී ඒ පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා පෝෂණ) හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ පාසල් සෞඛ්‍ය ඒකකය වෙත ලිඛිතව දැනුම් දෙන්න.

**5. පාසල් සෞඛ්‍ය දිනයේදී පවත්වන දැනුවත් කිරීමේ වැඩසටහන් වලට අමතරව අවශ්‍ය අවස්ථාවලදී පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදුකරන්න.**

6. අනාගත මාතෘ මරණ අවම කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් හෘද රෝග ඇතැයි සැක කරන ගැහැණු දරුවන්ගේ පසු විපරම පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

<u>සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු (විස්තර සඳහා ඇමුණුම සී බලන්න)</u>

1. පාසල් සෞඛ්‍ය සමාජය (පාසල තුල)
2. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන කමිටුව (පාසල තුල)
3. කොට්ඨාශ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව
4. කලාප සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව
5. පළාත් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව
6. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව
7. ජාතික මට්ටමේ අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා "පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන" සහ "සෞඛ්‍ය ප්‍රවර්ධන පාසලක් සඳහා අත්වැල " පරිශීලනය කරන්න.

**පාසල් සෞඛ්‍ය වැඩසටහන නියාමනය හා ඇගයීම**

පාසල් වෛද්‍ය පරීක්ෂණයේ 100% ආවරණය සඳහා වන අපගේ ඉලක්ක සපුරා ගැනීමට නියාමනය සෑම මට්ටමකම සිදුකල යුතුය. සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශ දෙක අතර සම්බන්ධීකරණය දියුණු කර ගැනීමට අවශ්‍ය නියාමනය සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු හරහා සෑම මට්ටමකින්ම ක්‍රියාත්මක කල යුතුය.

මෙම චක්‍රලේඛයේ අඩංගු තොරතුරු පිළිබඳව ඔබගේ කාර්ය මණ්ඩල හා ඔබේ පරිපාලනයේ පවතින ආයතන දැනුවත් කරන්න. ඔවුන් මෙම චක්‍රලේඛය පිළිපදින බවට වගබලා ගන්න.

ස්තූතියි .

........................................................
අනුර ජයවික්‍රම
ලේකම්/සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය

අනුර ජයවික්‍රම
ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්-

ලේකම්/අධ්‍යාපන අමාත්‍යංශය
අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)/සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
අතිරේක ලේකම්/අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන, අධ්‍යාපන අමාත්‍යංශය
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා II) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා)/සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
අධ්‍යක්ෂ (මාතෘ හා ළමා සෞඛ්‍ය)/පවුල් සෞඛ්‍ය කාර්යාංශය සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
අධ්‍යක්ෂ, සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය/සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය
ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ/වසංගත රෝග විද්‍යා අංශය
අධ්‍යාපන අධ්‍යක්ෂ/සෞඛ්‍ය හා පෝෂණ/අධ්‍යාපන අමාත්‍යංශය
අධ්‍යාපන අධ්‍යක්ෂ/ක්‍රීඩා/අධ්‍යාපන අමාත්‍යංශය
ලේකම්/රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
ලේකම්/ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය
ලේකම්/පශු සම්පත් ප්‍රවර්ධන අමාත්‍යාංශය
ලේකම්/ජල සම්පාදන හා ජලාප්‍රවාහන අමාත්‍යාංශය
ලේකම්/කෘෂිකර්ම අමාත්‍යාංශය
ලේකම්/ ක්‍රීඩා අමාත්‍යාංශය
සභාපති/පාරිභෝගික සේවා අධිකාරිය

ඇමුණුම ඒ

පාර්ශවකරුවන් විසින් පාසල් සෞඛ්‍ය කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ දී සැලකිය යුතුයි

A. පාසල් සෞඛ්‍ය කටයුතු සැලසුම් කර ඇති සෞඛ්‍ය අමාත්‍යංශයේ සියළුම විශේෂිත වැඩසටහන් භාර අධ්‍යක්ෂවරුන්, එම සැලසුම් පාසල් සෞඛ්‍ය වැඩසටහනෙහි මධ්‍ය කේන්ද්‍රිය ආයතනය වන පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ අධ්‍යක්ෂ/මාතෘ හා ළමා සෞඛ්‍ය මගින් පෙර වසරේ ඔක්තෝම්බර් 01 දිනට පෙර අධ්‍යාපන අමාත්‍යංශයේ සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් භාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

B. එම සෞඛ්‍ය කටයුතු සෑම විටම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් හරහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි/පාසල් වෛද්‍ය නිලධාරි/ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී - නගර සභාව මගින් ක්‍රියාත්මක කල යුතුය. කිසිවිටෙකත් ඔවුන්ගේ අනුදැනුමකින් තොරව පාසල් තුල සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක නොකළ යුතුය.

C. අධ්‍යාපන අමාත්‍යංශයේ ජාතික මට්ටමේ කමිටුව මගින් අනුමත නොකරන ලද සහ පළාත් අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්මට ඇතුළත් නොකරන ලද, රාජ්‍ය නොවන සංවිධාන/ව්‍යාපාර/පුද්ගලයන් මගින් පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය වැඩසටහන් සිදු නොකල යුතුයි.

D. එසේ අනුමත නොකල වැඩසටහන් සිදුකරන අවස්ථා වලදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ අනිකුත් රජයේ වෛද්‍ය නිලධාරින් උදව් දීම හෝ සහභාගී වීම නොකල යුතුය. එබඳු අවස්ථා පිළිබඳව පවුල් සෞඛ්‍ය කාර්යාංශයට හා අධ්‍යාපන අමාත්‍යංශයේ සෞඛ්‍ය/පෝෂණ වැඩසටහන භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත දැනුම් දිය යුතුය.

ඇමුණුම බී - පාසල් වෛද්‍ය පරීක්ෂණය

A. පාසල් වෛද්‍ය පරීක්ෂණය සියළු රජයේ පාසල්, විශේෂ අධ්‍යාපන ඒකක, පිරිවෙන් හා පෞද්ගලික පාසල් (ඉල්ලීම් මත) වල වාර්ෂිකව සිදුකල යුතුය.

B. 200ට වැඩි ළමුන් සංඛ්‍යාවක් සිටින සියළුම පාසල් වල වෛද්‍ය පරීක්ෂණය වාර්ෂිකව 1,4,7,10 ශ්‍රේණිවල හා විශේෂ අධ්‍යාපන ඒකකවල සිසුන් සඳහා සිදුකල යුතුය. 200 හෝ ඊට අඩු ළමයින් සංඛ්‍යාවක් සිටින පාසල් වල සියළුම ළමුන් වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයට භාජනය කළ යුතුවේ.

C. පසුගිය වසරේදී පාසල් වෛද්‍ය පරීක්ෂණය සිදු නොකල පාසල් සඳහා මෙම වසරේදී ප්‍රමුඛතාවය ලබාදිය යුතුයි.

**D. පාසල් සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ආවරණය කිරීමේ සහ නියාමනයේදී, ප්‍රාදේශීය මට්ටමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරු (නගර සභා බල ප්‍රදේශ තුල ප්‍රධාන වෛද්‍ය නිලධාරීන් /පාසල් වෛද්‍ය නිලධාරීන් ද) කේන්ද්‍රීය වගකීම දරණ නිලධාරීන් බවට පත්වේ. ඔවුනගේ අධීක්ෂණය යටතේ පාසල තුල පාසල් සෞඛ්‍ය වැඩසටහන සංවිධානය හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම මහජන සෞඛ්‍ය පරීක්ෂක සතුවේ.**

E. කොට්ඨාශ භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී / අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, විදුහල්පතිවරුන් සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කොට මෙම කටයුතු සැලසුම් කල යුතුය. පාසල් සෞඛ්‍ය කාර්තු ඉදිරි වැඩසටහන (H 1016) මේ අනුව පිළියෙළ කල යුතුය.

F. සිදුකරන පාසල් සෞඛ්‍ය කටයුතු අධ්‍යාපන අමාත්‍යංශයේ පළාත්, කළාප සහ කොට්ඨාස අධ්‍යක්ෂවරුන් සමඟ සැලසුම් කර ඒවා පළාත් සෞඛ්‍ය, සහ **පළාත් අධ්‍යාපන ආංශික සංවර්ධන සැලසුමට** ඇතුළත් කල යුතුයි.

G. අධ්‍යාපන අමාත්‍යංශය මගින් පාසල් වෛද්‍ය පරීක්ෂණය පවත්වන දිනය "පාසල් සෞඛ්‍ය දිනයක්" ලෙසට ප්‍රකාශයට පත්කොට ඇති අතර සියළුම සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහ පාසල් ප්‍රජාව (නිවාරණ හා ප්‍රතිකාර අංශවල) එක්ව එදිනට පාසල් සෞඛ්‍ය කටයුතු සැලසුම් කල යුතුය.

H. පාසල් වෛද්‍ය පරීක්ෂණය සඳහා නියම කරගත් දිනට අවම වශයෙන් සති 2 කට පෙර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පාසලට/විදුහල්පතිට වෛද්‍ය පරීක්ෂණය හා ප්‍රතිශක්තිකරණ වැඩසටහන පිළිබඳව නැවත දැනුම් දීම කළ යුතුය. අනතුරුව විදුහල්පති විසින් 1 ශ්‍රේණියේ සියළුම සිසුන්ගේ දෙමාපියන්ට සහ අදාල ශ්‍රේණිවල සෞඛ්‍ය ගැටළු සහිත දරුවන්ගේ දෙමාපියන්ට එම දිනයේදී සහභාගී වීමට දැනුම් දිය යුතුය.

I. විදුහල්පති විසින් ළමා සෞඛ්‍ය වර්ධන සටහන ගෙනඒමට සහ ප්‍රතිශක්තිකරණ සඳහා ලිඛිත අවසර ලබාගැනීමට දෙමාපියන් දැනුවත් කල යුතුය.

J. වෛද්‍ය පරීක්ෂණය දිනයට පෙර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පෙර පරීක්ෂණය සිදු කළ යුතුය.

K. ළමුන් වෛද්‍ය පරීක්ෂණයට ලක් කිරීම සෑම විටම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/වෛද්‍ය නිලධාරී/ලියාපදිංචි වෛද්‍ය නිලධාරී හෝ සහකාර වෛද්‍ය නිලධාරියෙකු විසින් සිදුකල යුතුය.

L. ප්‍රතිශක්තිකරණය තනි කටයුත්තක් ලෙස නොව වෛද්‍ය පරීක්ෂණයේම කොටසක් ලෙස සිදුකල යුතුය. මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පාසල් වෛද්‍ය පරීක්ෂණ දිනයේදීම ප්‍රතිශක්තිකරණ කටයුතු සිදුකල යුතුයි. පාසල් දරුවන් සංඛ්‍යාව වැඩි අවස්ථාවලදී මේ සඳහා පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක, මහජන සෞඛ්‍ය හෙදි සොයුරිය හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ සහභාගීත්වය ලබාගත හැක.

M. හදිසි අසාත්මික තත්ත්වයන්ට ප්‍රතිකාර කිරීමට පුහුණු වූ වෛද්‍යවරයෙකු/මහජන සෞඛ්‍ය හෙදි සොයුරියක්/මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් එම ස්ථානයේ සිටිය යුතුය.

වැඩි විස්තර සඳහා වසංගතරෝග අංශය විසින් 23/08/2011 දින නිකුත් කරන ලද 01-20/2001 දරණ චක්‍රලේඛය බලන්න.

| | |
|---|---|
| ද්විත්ව/ පෝලියෝ (DT/OPV) | 1 ශ්‍රේණියේ සියළු ළමුන් සඳහා, කලින් ලබාදී නොමැති නම් |
| වැඩිහිටි පිටගැස්ම ගලපටල (aTd) | 7 ශ්‍රේණියේ සියලු ළමුන් සඳහා |
| MMR | රුබෙල්ලා අඩංගු එන්නතක් කලින් ලබාදී නොමැති 8 ශ්‍රේණියේ සියලු ළමුන් සඳහා |

N. ලබාදුන් සියළු එන්නත් ළමා සෞඛ්‍ය වර්ධන සටහනෙහි (CHDR) සටහන් කළ යුතුය.

O. සම්පූර්ණ කරන ලද එන්නත් වාර්තාව එම කාර්තුවට පසු කාර්තුවේ පළමු මස 15 දිනට පෙර ප්‍රතිශක්තිකරණ කාර්තු වාර්තාවට ඇතුලත් කිරීම සඳහා මහජන සෞඛ්‍ය හෙදි සොහොයුරියට ලබාදිය යුතුය.

P. ශරීර ස්කන්ධ දර්ශකය මැනගැනීම, තක්සේරු කර මැදිහත්වීම් කර ගැනීම, තමන්ගේ ආහාර වේලෙහි පෝෂණ වටිනාකම මැන බැලීම, තනිව ඇස් පරීක්ෂා කර ගැනීම හා තමාගේ ශරීරික යෝග්‍යතාවය මැන බැලීමටත් අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීමටත් පාසල් ගුරුවරුන් සහ දරුවන් බලකරණය කල යුතුය.

Q. වෛද්‍ය පරීක්ෂණයට සහභාගි නොවූ සිසුන් වෙනත් දිනයකදී හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සෙනසුරාදා දින පවත්වන මධ්‍යම සායනයේ දී පරීක්ෂා කොට අවශ්‍ය සේවා ලබාදිය යුතුය.

R. වෛද්‍ය පරීක්ෂණයේදී හඳුනාගන්නා ලද ආබාධ සහිත දරුවන් ළමා රෝග විශේෂඥ වෛද්‍ය හෝ අදාල විශේෂඥ සායන වෙත යොමු කරන්න (H 606). මෙසේ යොමු කරන ලද ළමුන් බාහිර රෝගී අංශය හරහා යායුතු නැත.

S. හැසිරීමේ සහ මානසික ගැටළු ඇති ළමුන් මනෝ වෛද්‍ය විශේෂඥ/වෛද්‍ය නිලධාරී-මානසික සෞඛ්‍ය වෙත යොමු කළ යුතුය.

T. බාහිර රෝගී අංශයේ සහ විශේෂඥ සායනවලදී යොමු කරන ලද පාසල් දරුවන්ට මුලිකත්වය ලබාදීමට රෝහල් ප්‍රධානීන් කටයුතු කල යුතුය. (පොදු චක්‍රලේඛ අංක 02-32/2002). එසේ යොමු කරන ලද දරුවන් පෝලීමේ නොතබා ප්‍රතිකාර ලබාදීමට ආයතන ප්‍රධානීන් කාරුණිකව සහතික විය යුතුය. සෙනසුරාදා දිනවල හෝ සතියේ දින සවස් වරුවේ පාසල් දරුවන් සඳහා විශේෂඥ සායන පැවැත්විය යුතුවේ.

U. අවුරුදු 5 -19 ත් අතර පාසල් දරුවන්ගේ <u>වයසට අදාල ශරීර ස්කන්ධ දර්ශකය</u> තක්සේරු කිරීම සඳහා WHO Growth Standerd භාවිතා කරන්න පාසල් දරුවකුගේ <u>වයසට අදාල ශරීර ස්කන්ධ දර්ශකය</u> <–SD ලෙස හඳුනාගතහොත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ පළමුවෙන්ම පැවැත්වෙන සායනය වෙත යොමු කරන්න. නිවැරදි නොවූ ගැටළු විශේෂඥ වෛද්‍යසායනය වෙත යොමු කරන්න. පාසල් දරුවකුගේ වයසට අදාල ශරීර ස්කන්ධ දර්ශකය 2SD ට වැඩිනම් හෝ අධික නිරක්තියෙන් පෙළේ නම් වහාම විශේෂඥ වෛද්‍ය වෙත යොමු කරන්න. මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් අධි බර, මිටි හෝ රක්තහීනතාවයෙන් පෙළෙන අනෙකුත් දරුවන්හට පෝෂණ සහ ජීවන රටාව නිවරදි කරගන්නා ආකාරය පිළිබඳ දැනුවත් කරන්න. පසු විපරමේදී නිවැරදි නොවූ පෝෂණ ගැටළු සහිත දරුවන් සෞ.වෛ.නි කාර්යාලයේ පෝෂණ සායනය වෙත යොමු කරන්න.

V. සෞඛ්‍ය ගැටළු සටහන (H 456) පිටපත් කොට එක් පිටපතක් පන්ති භාර ගුරුභවතාට සහ පාසල් වෛද්‍ය පරීක්ෂණ සාරාංශය පාසල් හා සෞඛ්‍ය සමීක්ෂණ වාර්තාවේ (H 1015 හා 1247) පිටපතක් විදුහල්පතිට ලබාදී දැනුවත් කර ආබාධ නිවැරදි කරන බවට එමගින් සහතික විය යුතුය.

W. පසු විපරම් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් වෛද්‍ය පරීක්ෂණයෙන් මාස 1 කට සහ මාස 3 කට පසු (අවම වශයෙන් දෙවතාවක්) පාසලට යා යුතුය. අනාගත මාතෘ මරණ අවම කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් හෘද රෝග ඇතැයි සැක කරන ගැහැණු දරුවන්ගේ පසු විපරම පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

X. පසු විපරම් අවස්ථාවලදී අදාල විශේෂඥ සායන සඳහා සහභාගී නොවූ දරුවන් හඳුනාගතහොත් ඔවුන් යලි සායන වෙත යොමුකිරීමට බලකරණය කල යුතුය.

Y. ඇස් කණ්ණාඩි හෝ ශ්‍රවණාධාරක අවශ්‍ය සිසුන් එම වට්ටෝරු සමඟ පළාත් අධ්‍යාපන කාර්යාලයේ විශේෂ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත හෝ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරි වෙත යොමු කිරීමෙන් ඒවා නොමිලේ ලබාගත හැක. ඇස් කණ්ණාඩි සඳහා ආධාර සෞඛ්‍ය අමාත්‍යාංශයේ vision 2020 ඒකකය මගින්ද ලබාගත හැක. මේ සම්බන්ධව ගුරුවරුන් දැනුවත් කල යුතුය.

Z. මදුරු මර්ධන වැඩසටහන්, පාසල් ආපන ශාලා අධීක්ෂණය යකඩ, ෆෝලික් අම්ල, විටමින් සී අතිරේකය ලබාදීමේ වැඩසටහන නියාමනය (WIFS) සහ ගුරුවරුන් සඳහා බෝ නොවන රෝග සායනය/සුවනාරි සායන මෙම දිනය තුල පැවැත්වීමට කටයුතු කරන්න.

AA. චක්‍රලේඛයේ සඳහන් පරිදි දරුවන් දැනුවත් කිරීමේ දේශණ හෝ වැඩසටහන් මෙම දිනය තුල පැවත්වීමට කටයුතු කරන්න.

BB. සියලුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සෑම මසකම අවසානයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මාර්ගෝපදේශනයට අනුව මාසික වාර්තාව (H 1014) පිළියෙළ කොට, ප්‍රධාන පත්‍රිකාව සම්පූර්ණ කිරීම සඳහා පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකට භාරදිය යුතුය.

CC. පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් කාර්තු වාර්තාව (H 797) සකස් කොට, සෑම කාර්තුවකටම පසු පළමු මාසයේ 20 දිනට පෙර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මාතෘ හා ළමා සෞඛ්‍ය වෙත පිටපත් එවිය යුතුය.

DD. මෙම වාර්තා නියමිත දිනට ලබාදීම අනිවාර්ය වේ.

ආකෘතිපත්‍ර පිරවීමේ ගැටළු නිරාකරණය කරගනු පිණිස, පවුල් සෞඛ්‍ය කාර්යාංශය විසින් සම්පාදිත පාසල් සෞඛ්‍ය දත්ත පද්ධතියට අදාල ආකෘතිපත්‍ර පිරවීම සඳහා උපදෙස් පොත බලන්න. මේ සඳහා 2015 දී සංශෝධනය කර මුද්‍රණය කල ආකෘතිපත්‍ර භාවිතා කරන්න.

ඇමුණුම සී- සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු

1. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ශිෂ්‍ය සමාජය

| සංයුතිය | කමිටුවේ කාර්යභාරය | කමිටුව පිහිටුවීමේ වගකීම | කමිටුව නියාමනය |
|---|---|---|---|
| සභාපති/ උප සභාපති / සම ලේකම්වරුන්/ භාණ්ඩාගාරික හා කාරක සභිකයින් සිසුන් අතරින් පත් කෙරේ<br><br>සමාජිකත්වය - ඕනෑම ශිෂ්‍ය සංඛ්‍යාවකට ලබාගත හැක<br><br>පාසලේ අවශ්‍යතාවය මත උප කමිටු පිහිටුවාගත හැක<br><br>සෞඛ්‍ය වැඩසටහන් භාර නියෝජ්‍ය විදුහල්පති/ අංශ ප්‍රධාන/අදාල ගුරු භවතා ගුරුවරුන් මෙම කමිටුවේ උපදේශකත්වය දරනු ලැබේ. (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන /ජීවන නිපුණතා/ විද්‍යාව හෝ වෙනත් ගුරු භවතෙකු විය හැක.) | පාසල් ප්‍රජාව සමග සෞඛ්‍ය කටයුතු සැලසුම් කොට ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය සමාජය මුලිකත්වය ගනි | විදුහල්පති | මාසික නියාමනය - උපදේශකත්වය දරනු ලබන ගුරුවරුන් හා කමිටු සමාජිකයන්<br><br>ත්‍රෛමාසික නියාමනය - විදුහල්පති ගුරුවරුන් හා කමිටු සමාජිකයන්<br><br>වාර්ෂික නියාමනය - විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |

**ප්‍රමුඛත්වය දී සිදුකල යුතු ක්‍රියාකාරකම්**

පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්තියක් සකස් කිරීම

සෞඛ්‍ය ප්‍රවර්ධන වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කිරීම, පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුවේ අනුමැතිය ලබාගැනිම හා ක්‍රියාත්මක කිරීම

පාසල් හැරයන ළමුන් සංඛ්‍යව අවම කිරීම සඳහා ක්‍රමවේදයක් පාසල තුල ඇතිකිරීම

පාසල් දරුවන්ගේ ශරීර ස්කන්ධ දර්ශකය, පෝෂණ මට්ටම හා ශාරීරික යෝග්‍යතා මට්ටම නියාමනය

වාර්ෂිකව පාසල් සෞඛ්‍ය දිනයක් පැවැත්විම

වාර්ෂික ක්‍රියාකාරකම් සැලසුමෙහි අඩංගු කලහැකි ක්‍රියාකාරකම්

(a) පාසල් සෞඛ්‍ය සමාජයේ මාසික රැස්වීම
(b) විශේෂ ක්‍රියාකාරකම් පැවැත්වීම - ආරාධිතයන්ගේ දේශන, සාකච්ඡා, කෙටි නාට්‍ය, චිත්‍රපට ආදිය
(c) දිනපතා සෞඛ්‍ය කතා, පොදු ඇමතීම් සිදුකිරීම
(d) සෞඛ්‍යට සම්බන්ධ තරඟ පැවැත්විම - උදා- නාට්‍ය, ප්‍රදර්ශන, දේශන, විවාද
(e) සෞඛ්‍ය ප්‍රවර්ධන බිත්ති පුවත්පත් පවත්වාගෙන යාම
(f) සෞඛ්‍යමත් ආපනශාලා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය දීම
(g) සෞඛ්‍ය සම්පත් මධ්‍යස්ථානයක් ඇති කර එහි අවශ්‍යකරන පත්‍රිකා, විඩියෝ, පෝස්ටර්, පත්තර, ලිපි ආදිය භාවිතය සඳහා තැබීම

(h) සහවර අධ්‍යාපන වැඩසටහන් සංවිධානය
(i) ජීවන නිපුණතා වර්ධනය කිරීමේ වැඩසටහන් තුලින් පාසල තුල ගැටුම්, හිංසනය, අපයෝජන අවම කිරීම, අවදානම් ලිංගික හැසිරීම් අඩු කිරීම සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් වැඩි කිරීම
(j) සතිපතා යකඩ, ෆෝලික් අම්ල, විටමින් සී අතිරේකය ලබාදීමේදී ගුරුවරුන්ට සහාය දීම
(k) පාසල් සෞඛ්‍ය සමීක්ෂණයෙන් හඳුනාගත් ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කිරීම
(l) කුණු කසල බැහැරලීමේ ක්‍රමවේදයක් තිබීම සහ පරිසරය පිරිසිදුව පවත්වා ගැනීමට ක්‍රියාකිරීම
(m) ඩෙංගු වැනි මදුරුවන් මගින් බෝවන රෝග පාලනයට උපකාරී වීම
(n) පාසල තුළ බීමට සුදුසු ජලය ලබාදීමට උදව් කිරීම
(o) පාසල තුළ වැසිකිළි පිරිසිදු කිරීමේ ක්‍රමවේදයක් සැකසීම
(p) පාසල් වෛද්‍ය පරීක්ෂණයට උදව් කිරීම
(q) සෞඛ්‍ය ගැටළු සටහන (H456) පිළිබඳ තොරතුරු පංතිභාර ගුරුවරුන්ගෙන් ලබාගැනීම සහ සාරාංශයක් පිළියෙල කිරීම
(r) ඊට අනුකූලව ප්‍රධාන සෞඛ්‍ය ගැටළු වැලැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
(s) ආබාධ සහිත දරුවන් පසු විපරම් කිරීම්
(t) පාසල් ප්‍රජාවට යහපත් සෞඛ්‍ය පුරුදු ඇතිකර ගැනිමට දිරිගැන්වීම
(u) දිවා ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට උදව් කිරීම
(v) ප්‍රථමාධාර මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සහ අවශ්‍ය අවස්ථාවල ප්‍රථමාධාර ලබාදීමට කටයුතු කිරීම

2. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන උපදේශන කමිටුව

| සංයුතිය | කමිටුවේ කාර්යභාරය | කමිටුව පිහිටුවීමේ වගකීම | කමිටුව නියාමනය |
|---|---|---|---|
| අධ්‍යාපන අංශය<br>විදුහල්පති (සභාපති)<br>නියෝජ්‍ය විදුහල්පති<br>අංශ ප්‍රධාන<br>අදාල ගුරු භවතා<br>ගුරුවරු - (ශිෂ්‍ය සංඛ්‍යාව මත පත් කිරීමට විදුහල්පතිට අවකාශ ඇත. (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන/ජීවන නිපුණතා / විද්‍යාව හෝ වෙනත් ගුරු භවතෙකු විය හැක.)<br><br>ශිෂ්‍ය නියෝජිතයන් - පාසල් සෞඛ්‍ය සංගමයේ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික<br><br>දෙමාපිය නියෝජිතයන්<br><br>සෞඛ්‍ය අංශය<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක<br><br>වෙනත්<br>සමෘද්ධි සංවර්ධන නිලධාරි<br>බාහිර සුභ පතන්නන් | සෞඛ්‍ය සමාජය විසින් සකස් කරන ලද වාර්ෂික සෞඛ්‍ය සැලැස්ම අනුමත කිරීම<br>ඒ සඳහා අවශ්‍ය සම්පත් සපයාදීම<br>සෞඛ්‍ය ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වීම<br>නියාමනය<br>ප්‍රතිපෝෂණය | විදුහල්පති<br><br>මහජන සෞඛ්‍ය පරීක්ෂක | ත්‍රෛමාසික නියාමනය - විදුහල්පති ඇතුළු කමිටු සමාජිකයන්<br><br>වාර්ෂික නියාමනය - විදුහල්පති හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |

3. කොට්ඨාශ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව

| සංයුතිය | කමිටුවේ කාර්යභාරය | කමිටුව පිහිටුවීමේ වගකීම | කමිටුව නියාමනය |
|---|---|---|---|
| අධ්‍යාපන අංශය<br>කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ (සභාපති)<br>කොට්ඨාශ සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය /සහකාර අ.අ.<br>කොට්ඨාශ අධ්‍යාපන නිලධාරීන්<br>විදුහල්පතිවරුන්<br><br>සෞඛ්‍ය අංශය<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී / අතිරේක සෞ. වෛ. නිලධාරී<br>පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂක<br>සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී<br><br>වෙනත්<br>සමෘද්ධි සංවර්ධන නිලධාරී | සපයා ඇති පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ඇගයීම් ලැයිස්තුව අනුව පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඇගයීම<br><br>සිදුකරන ලද පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු පිළිබඳව ප්‍රතිපෝෂණය කිරීම | කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂ | කොට්ඨාශ මට්ටමින් මාස 6කට වරක් අදාල විදුහල්පතිවරුන් විසින් ප්‍රගතිය ඉදිරිපත් කල යුතුය<br><br>කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂක හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කල යුතුයි |

4. කලාප සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව

| සංයුතිය | කමිටුවේ කාර්යභාරය | කමිටුව පිහිටුවීමේ වගකීම | කමිටුව නියාමනය |
|---|---|---|---|
| අධ්‍යාපන අංශය<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (සභාපති)<br>කලාප සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් භාර නියෝජ්‍ය/සහකාර අ.අ.<br>කොට්ඨාශ අ.අ. වරුන්<br>ගණකාධිකාරී (කළාප අධ්‍යාපන කාර්යාලය)<br>විදුහල්පතිවරුන් හතරදෙනෙකු (1AB,1C,Type2,Type3 පාසල් වලින් එක් විදුහල්පති බැගින්)<br><br>සෞඛ්‍ය අංශය<br>වෛද්‍ය නිලධාරී / මාතෘ හා ළමා සෞඛ්‍ය<br>ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ විසින් නම් කරන ලද නිලධාරීන් (ප්‍රාදේශීය වසංගතරෝග විශේෂඥ, ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍ය)<br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්<br>දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂක<br>සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී<br><br>වෙනත්<br>සමෘද්ධි සංවර්ධන නිලධාරී | සපයා ඇති පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන ඇගයීම් ලැයිස්තුව අනුව පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඇගයීම<br><br>සිදුකරන ලද පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු පිළිබඳව ප්‍රතිපෝෂණය කිරීම<br><br>රන් පදක්කම් සඳහා සුදුසුකම් ලත් පාසල් ලැයිස්තුව අධ්‍යාපන අමාත්‍යංශයට ලබාදීම | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වාර්ෂිකව ප්‍රගතිය ඉදිරිපත් කල යුතුයි.<br><br>කලාප මට්ටමින් පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු **කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක** හා<br>මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී/<br>දිස්ත්‍රික් හා පලාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥ<br>විසින් නියාමනය කල යුතුය |

කලාපය තුල පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු නියාමන වාර්තා අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ, සෞඛ්‍ය/පෝෂණ වෙත යවන්න.

5. පළාත් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව

| සංයුතිය | කමිටුවේ කාර්යභාරය | කමිටුව පිහිටුවීමේ වගකීම | කමිටුව නියාමනය |
|---|---|---|---|
| අධ්‍යාපන අංශය<br>පළාත් අධ්‍යාපන ලේකම් (සභාපති)<br>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු<br>සෞඛ්‍ය හා පෝෂණ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්<br>ගණකාධිකාරී (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව)<br><br>සෞඛ්‍ය අංශය<br>පළාත් සෞඛ්‍ය ලේකම්<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br>ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරු<br>පළාත් ප්‍රජා වෛද්‍ය විශේෂඥවරුන්<br>මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්<br>පළාත් පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂක<br>දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂකවරු<br><br>වෙනත්<br>දිස්ත්‍රික් සමෘද්ධි සහකාර කොමසාරිස් | ජාතික සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති පළාතට අනුකූලව සකස්කර ගැනීම<br>පළාතේ සෞඛ්‍ය ගැටළු නිරාකරණය කිරිමට කටයුතු කිරිම<br>වාර්ෂිකව වැඩසටහන ඇගයීම<br>පාසල් සෞඛ්‍ය කටයුතු සාර්ථකව සිදුකිරිම සඳහා ප්‍රතිපෝෂණය කිරීම | පළාත් අධ්‍යාපන ලේකම් | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් ප්‍රගතිය ඉදිරිපත් කල යුතුයි<br><br>පළාත් අධ්‍යාපන ලේකම් වාර්ෂිකව නියාමනය කල යුතුයි |

6. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව

| සංයුතිය | කමිටුවේ කාර්යභාරය | කමිටුව පිහිටුවීමේ වගකීම | කමිටුව නියාමනය |
|---|---|---|---|
| සෞඛ්‍ය අංශය<br>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)<br>නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/(ම.සෞ.සේ 1 )<br>නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/(ම.සෞ.සේ 11 )<br>නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/(අධ්‍යාපන පුහුණු හා ව්‍යාපෘති)<br>නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/(සැලසුම්)<br>අධ්‍යක්ෂ/ මාතෘ හා ළමා සෞඛ්‍ය<br>අධ්‍යක්ෂ/ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය<br>අධ්‍යක්ෂ/ බෝ නොවන රෝග<br>අධ්‍යක්ෂ/ පෝෂණ | පාසල් සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සැකසීම<br><br>වැඩසටහන ඇගයීම සහ නියාමනය<br><br>පාසල් සෞඛ්‍ය පිළිබඳ ගැටළු නිරාකරණය<br><br>චක්‍රලේඛ උපදෙස් පිළිපදිමින් වැඩසටහන ක්‍රියාත්මක කරන බවට සියළු නිලධාරීන් වගකිව යුතුය | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් |

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ/ පෝෂණ සම්බන්ධීකාරක | | | |
| අධ්‍යක්ෂ/නගර සහ වතු සෞඛ්‍ය | | | |
| අධ්‍යක්ෂ/ ජාතික සෞඛ්‍ය විද්‍යායතනය | | | |
| ප්‍රධාන වසංගතරෝග විද්‍යඥ | | | |
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ 02 | | | |
| පාසල් සෞඛ්‍ය වැඩසටහන් භාර ප්‍රජා වෛද්‍ය විශේෂඥ | | | |
| යෞවන සෞඛ්‍ය වැඩසටහන් භාර ප්‍රජා වෛද්‍ය විශේෂඥ | | | |
| මුඛ සෞඛ්‍ය වැඩසටහන් භාර ප්‍රජා දන්ත වෛද්‍ය විශේෂඥ | | | |
| මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී 01 | | | |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී 01 | | | |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී කොළඹ මහ නගර සභාව | | | |
| ගණකාධිකාරී සෞඛ්‍ය අමාත්‍යාංශය | | | |
| ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක | | | |
| අධ්‍යාපන අංශය | | | |
| අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) | | | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා පෝෂණ) | | | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ (ක්‍රීඩා) | | | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන) | | | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ (විද්‍යා) | | | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන) | | | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ (මත්ද්‍රව්‍ය නිවාරණ), | | | |
| ජාතික වැඩසටහන් නිලධාරී (සෞඛ්‍ය)/ | | | |
| ජාතික අධ්‍යාපන ආයතනය | | | |
| වෙනත් | | | |
| ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු | | | |
| මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයකු | | | |
| ක්‍රීඩා අමාත්‍යාංශයේ නියෝජිතයකු | | | |
| ළමාරක්ෂණ අධිකාරියේ නියෝජිතයකු | | | |
| ළමා ලේකම් කාර්යාලයේ නියෝජිතයකු | | | |

7. ජාතික මට්ටමේ අධ්‍යාපන සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව

| සංයුතිය | කමිටුවේ කාර්යභාරය | කමිටුව පිහිටුවීමේ වගකීම | කමිටුව නියාමනය |
|---|---|---|---|
| අධ්‍යාපන අංශය<br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (සභාපති)<br>අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)<br>අතිරේක ලේකම් (සැලසුම් හා කාර්යසාධන සමාලෝචන)<br>අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා පෝෂණ)<br>අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන)<br>අධ්‍යාපන අධ්‍යක්ෂ (ක්‍රීඩා)<br>අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන)<br>ප්‍රධාන ගණකාධිකාරී<br><br>සෞඛ්‍ය අංශය<br>ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය<br>අතිරේක ලේකම් (සෞඛ්‍ය සේවා)<br>සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්<br>නි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්(ම.සෞ.සේ 11)<br>අධ්‍යක්ෂ/ මාතෘ හා ළමා සෞඛ්‍ය<br>අධ්‍යක්ෂ/ සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය<br>වැඩසටහන් භාර ප්‍රජා වෛද්‍ය විශේෂඥ/පවුල් සෞඛ්‍ය කාර්යාංශය<br><br>වෙනත්<br>ලේකම්, ආර්ථික කටයුතු සංවර්ධන අමාත්‍යාංශය<br>ලේකම් පශු සම්පත් ප්‍රවර්ධන අමාත්‍යාංශය<br>ලේකම් ජල සම්පාදන හා ජලාප්‍රවාහන අමාත්‍යාංශය<br>ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය<br>ලේකම් ක්‍රීඩා අමාත්‍යාංශය<br>සභාපති පාරිභෝගික සේවා අධිකාරිය | පාසල් සෞඛ්‍ය ජාතික පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම<br>වැඩසටහන නියාමනය කිරීම හා ඇගයීම<br>වැඩසටහනේ ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කිරීම<br><br>පාසල් සෞඛ්‍ය වැඩසටහන සාර්ථකව ඉටු කිරීම සඳහා මෙම චක්‍රලේඛ උපදෙස් පිළිපදින බවට නිලධාරීන් වගබලා ගත යුතුවේ | ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය | ද්වි මාසික |

එක් එක් කමිටු ස්ථාපිත කිරීම සහ නිසි වකවානුවල කමිටු රැස්වීම් පැවැත්වීම සෑම කමිටුවකම සභාපතිවරුන් සතු වගකීමකි.